පහලොස් වසකට පසුව කැලණි කදු හිස පිස හමන සහොදර සුළඟ...

කලණාවර්ජන 2024

සරසවි ඇත්දැකීම හැම මනුස්සයෙක්ගෙම හීනයක්. අසීමිත කැපකිරීම් කරල රැකගත්තු නිදහස් අධ්‍යාපන ඉතිහාසය ඇතුලෙ ඒ සීමිත ඉඩෙන් රිංගල ඒ හීනෙට යන්නෙ අල්ප වූ මිනිස්සු කොට්ඨාශයක්. සමවයස්, සමඅදහස්, සහිත ඒ වසර 4 හෝ 3 ඇතුලෙ වචනයේ පරිසමාප්තයෙන්ම "සහෝදරත්වය " අත්විදීමට හැම විද්‍යාර්ථියෙක්ටම අවස්ථාව ලැබෙනවා.

තම තමන්ගෙ උපාධි සහතිකයත්, ලෝගුවත්, උපාධි කැප් එකත් ඒ හමුවීම් වල අවසන් ඉම... අයෙ විසිරෙනවා තම තමන්ගෙ උපන් ගම් බිම් වලට, තවත් සමහරෙක් රැකියාව එක්ක දුරකට, තවත් අය විවාහය එක්ක ඒ ඒ ඉමව් වලට..

කැලණියටත් ඒ අත්දැකීම පොදුයි. ඒ පොඩි කන්ද මුදුනට කැලණි ජීවිත රොක් උනේ එහෙම. එහෙම හමුවෙන වෙන්වෙන ජීවිත කාලෙට පස්සෙ නැවත හමුවීම මොනතරම් සොදුරුදැයි අමුතුවෙන් කියන්න අවශ්‍ය නෑ .

කලණාවර්ජන -2024 එවැනි සෞදයීත්මක හමුවීමක් ..

මේ වැඩේ ගැන අපිට කිව්වෙ අනුජ කහදවආරච්චි මහතා (2004/05 අධ්‍යයන වර්ෂය සහ කලා පීඨය නියෝජනය කරමින් )

ඔව්.. ඇත්තටම මේ හමුවීම වසර 4 ක් එකට හිටියටත් වඩා ජීවිත වලට දැනෙන හමුවීමක් වෙයි කියල අපි හිතනවා .

අපි කැම්පස් ආවෙ 2005 මැයි මාසෙ පහළොස් වෙනිදා .හරියටම අවුරුදු අවුරුදු 19 කට කලින් .. කලා, විද්‍යා 2004/05, සහ වානිජ 2003/04/05 (යුගල ) සමූහයක් විදියට .. ඒ හින්දා අපෙ සමූහය විශාල එකක් උනා.. බොහොම සුන්දර ප්‍රථම දෙවන වසරවල් හිනාව, කදුළු එක්කත් ,තෙවන සිව්වන වසරවල් බොහොම යුහුසුළුවත් ගෙවුනා.. 2009 අපි වෙන්වෙල ගියාට පස්සෙ අතිශය ප්‍රථම හමුවීම මේ .

ගොඩක් සහෝදරවරු,සහෝදරීයො වෙනස්ම තරාතිරම් වල, ඉස්සර තරුණ ජීවිත විදියට හම්බවෙච්ච අපි දැන් හම්බෙන්නෙ මව්වරු පියවරු විදියට දුවා දරුවොත් එක්ක. ඒ හින්දා මේක ඇත්තටම හිටිය කාලෙට වඩා හෘදයාංගම හමුවීමක් වෙයි. කලණාවර්ජන කියල නම යෙදෙන්නෙත්, හෘදයාංගමයන්ගේ සරසවි මතකාවලෝකනය" කියල ඉල්ලීමක් තේමාව යෙදෙන්නෙත් ඒ විදියට ..

මේ ගැන 2003/04 අධ්‍යයන වර්ෂය සහ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය නියෝජනය කරමින් අසංක වෙලගෙදර මහතා දැක්කුවේ මේ වගේ අදහසක් ..

අපි විශ්වවිද්‍යාල දිවියට සමු දී අවුරුදු 15 කට පස්සෙ හම්බවෙන්නෙ මේ දෙසැම්බර් මාසෙ 7 වෙනිදා .. ගම්පහ Wet Water Resort එක තමයි තැන. එදා දවස සංවිධානය වෙලා තියෙන්නේ අපෙ පැරණි මතක අලුත් කර ගන්න අපෙ කාගෙත් ආදරණීය නවාතැන්පලේ (කැලණිය විශ්වවිද්‍යාල පරිශ්‍රයේ) සංචාරයක් එක්ක ..

පස්සෙ උදේ 10.00 වෙනකොට අපි සේරම ගම්පහ Wet Water Resort එකට යනවා. එතෙන්ට යන්න ප්‍රවාහන පහසුකම් අවශ්‍ය අයට ලෑස්ති කරල තියෙනවා. කැම්පස් එකට එන්න අපහසු අයට කෙලින්ම සුහද හමුවෙමින් තියෙන තැනට උදේ 10 වෙද්දී එන්න කියල ආරාධනා කරනවා.

එතන ලොකු වැඩ ගොඩක් සැලසුම් කරලා තියෙනවා Annual General Meeting (AGM), එක එක්ක තව එදාට එන හැමෝටම විනෝද වෙන්න පුලුවන් විදියට එතන සංවිධානය වෙනවා. මේ වැඩේට අපේ සහෝදර සහෝදරයන් නන් අයුරින් සහයෝගය ලබා දෙනවා. ඒ අතරින් දැනට විදේශගතව සිටින අපගේ සහෝදර සහෝදරියන් විශේෂයෙන් මතක් කරන්න ඕනේ. සුහද හමුවට සහභාගි විය නොහැකි ඔවුන් වෙනුවෙන් Online ක්‍රමවේදයක් හරහා වැඩසටහන හා සම්බන්ධ වීමට වැඩපිළිවෙළක් සකසා තිබෙනවා.

ඇත්තටම මේ 2003/04/05 මේ සුහද හමුව " හෘදයාංගම සරසවි මතකාවලෝකනය - කලණාවර්ජන 2024 පෙර නොවූ විරූ අත්දැකීමක් වන බව නොවනුමානයි.එදා දවසට පස්සෙ නැවත අලුතින් ඉපදුන සහෝදරත්වය ජීවමාන වෙන හැටි අපිට දකින්න පුලුවන් වෙයි. එහෙම කිවුවෙ මේ සුහද හමුවෙ සංවිධායක කමිටුව වෙනුවෙන් අසංක වෙලගෙදර .